# මහනුවර ශ්‍රී දළදා පෙරහැරේ කරඬුව වැඩමකරවූ ප්‍රකට ඇත්තු

**තාරක උමයංග දිල්ශාන් / සමාධි නවෝද්‍යා පීරිස් ***

ශ්‍රී ලාංකීය සංස්කෘතිය තුළ පෙරහැර මංගල්‍ය සඳහා හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. සංස්කෘතික අංගයක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ පෙරහැර ඉතිහාසය දේවානම්පිය තිස්ස රජු දවස දක්වාම දිවයන බව වංශ කතා ඇසුරින් නිගමනය කළ හැකිය. දන්ත ධාතුන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවීමෙන් පසුව වාර්ෂිකව පූජා අර්ථයෙන් නගරය අලංකාර කර පෙරහැර පැවැත්වූ බව ෆාහියන් භික්ෂුවගේ වාර්තාවල සඳහන් වේ. කෘෂිකර්මාන්තය, ප්‍රවාහනය හා යුධ කටයුතු ආදිය සඳහා යොදාගනු ලැබූ හා රාජකීය ගමන් රථය ලෙස සැලකුණු හස්තියා මෙම පෙරහැර මංගල්‍යයේ ප්‍රධානතම විශේෂාංගය බවට දේවානම්පිය තිස්ස රජ සමය වන විටත් පත්ව සිටි බව පැහැදිලි වනුයේ ථූපාරාම ධාතු නිධානෝත්සවය සඳහා සර්වඥ ධාතූන් වහන්සේලා හස්තියෙකුගේ කර මතින් වැඩම කරවීමේ සිදුවීම තුළිනි. එතැන් පටන් ඉතිහාසයේ නොයෙකුත් අවස්ථාවලදී විවිධ කාර්යයන් සඳහා අලි ඇතුන් යොදාගත් අවස්ථා දක්නට ලැබේ. ඒ අනුව එවැනි ඉතිහාසයේ ප්‍රකට අලි ඇතුන් ලෙස කුංජර, පදුම, කණ්ඩුල හා මහා පර්වත ආදී අලි ඇතුන් ගණනාවක් පිළිබඳව මූලාශ්‍රවල සඳහන් වේ. දළදා පෙරහැර සංස්කෘතිය හා හස්තීන් අතර වූ බැඳීම සාමාන්‍ය ජනතාව තුළ හස්තීන් කෙරෙහි භක්තියක් ගෞරවයක් ඇති කිරීමට හේතු විය. මිනිසෙකුට නොලැබෙන භාග්‍යයක් වූ දළදා වහන්සේ කර මත තබා වැඩම කරවීමේ භාග්‍ය හිමි මෙම තේජවන්තයින්, බෝධිසත්ව ගුණෝපේත සත්වයින් ලෙස පිළිගැනීමට ජනතාව හුරුපුරුදු විය. එසේම අතීතයේදී අලි ඇතුන්ගෙන් ගැමි ජනයාට වන හානිය රජුගෙන් ලැබෙන දණ්ඩනයක් වශයෙන් පිළිගත යුතු වූ බවත් අලි ඇතුන්ට හානි කිරීමට මහජනතාවට අවසර

නොවූ බවත් රොබට් නොක්ස් සිය එදා හෙළදිව කෘතියෙන් දක්වා ඇත. ඒ අනුව දළදා කරඬුව වැඩම කරවීමේ වගකීම දරන්නන් වශයෙන් හස්තීන්ට ගෞරවයක්, පිළිගැනීමක් හා පූජනීයත්වයක් පෙර රජ දවස සිටම හිමි වූ බව පැහැදිලිය.

ඉතිහාසයේ පටන් අද දක්වාම පෙරහැර අලි ඇතුන් පිළිබඳව නොයෙක් විට සමාජය තුළ කතා බහ ඇති වුවත් දළදා කරඬුව වැඩම කරවන ඇත්තු සෑම විටම වැඩි අවධානය සොරා ගත්තවුන් වූහ. ඒ අනුව වාර්තා ගත ඉතිහාසයේ දළදා කරඬුව වැඩම වූ ඇතුන් අතරින් කිහිප දෙනෙක් ලෙස,

- ✓ අම්පිටියේ ඇතා
- ✓ මහරාජා ඇතා
- ✓ ඉඩම්පිටියේ ඇතා

* තාරක උමයංග දිල්ශාන් / සමාධි නවෝද්‍යා පීරිස්
ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය, පුරාවිද්‍යාව - කැලණිය විශ්වවිද්‍යාලය,

- ✓ කන්දා ඇතා
- ✓ සමන් රාජා ඇතා
- ✓ රුවන් රාජා ඇතා
- ✓ වැවලදෙණියේ ඇතා

යන ඇතුන් දැක්විය හැකිය. මීට අමතරව දළදා කරඬුව වැඩම කරවීමට තරම් භාග්‍යවත් වූත්, සුවිශේෂී අංග ලක්ෂණ, චරිත ලක්ෂණ හෝ හැසිරීම් රටා ආදී විවිධ හේතූන් නිසා සමාජය තුළ විශේෂ අවධානයට හා ජනාදරයට පාත්‍ර වූ ඇතුන් කිහිප දෙනෙකු ලෙස,

- ✓ රාජා ඇතා (දළදා මාලිගාව)
- ✓ හෙයියන්තුඩුවේ රාජා ඇතා
- ✓ මිල්ලන්ගොඩ ලොකු රාජා ඇතා
- ✓ නැදුන්ගමුව රාජා ඇතා

ආදී ඇතුන් හඳුනාගත හැකිය.

**රාජා හස්තියා**

මහනුවර ඓතිහාසික ශ්‍රී දළදා මාලිගාවේ සිටි රාජා ඇතා තම හස්ති පරම්පරාවේ අභිමානය ලොවට විදහා දක්වමින් අභිමානවත් සේවයක් ඉටුකොට බුදුරදුන්ට පූජා පවත්වා මිනිසාගෙන් ගෞරව පූජා ලැබූ හස්තියෙකි. ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ මඩකලපුව එරාවුර් ප්‍රදේශයේ වනයකින්, ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරන ලද අංක 1318 දරණ අලි ඇල්ලීමේ බලපත්‍රයට අනුව 1925 වසරේ නොවැම්බර් මසදී අලි ඇල්ලීමේ දක්ෂයෙකු වූ මුස්ලිම් ජාතික උරුමේ ලෙබ්බේ විසින් මෙම හස්තියා අල්ලා ගන්නා ලදී. මෙහිදී අල්ලා ගනු ලැබූ තවත් ඇත් පැටවෙකුද සමඟ මෙම ඇත් පැටවා උරුමේ ලෙබ්බේ විසින් මහනුවර ගිරාගම වලව්වේ ටිකිරි බණ්ඩාර මාම්පිටිය දිසාවේට රුපියල් 3300ක මුදලකට විකුණා ඇත. ඒ 1925 දෙසැම්බර් මස 11 වන දිනය. එවිට රාජාගේ උස අඩි 8ක් සහ කන්දාගේ උස අඩි 7 ½ බව ඔප්පුවේ තොරතුරු මත අනාවරණය වේ. 1987 ජූලි 31 වන දින මහනුවරදී අත්සන තබන ලද පූජා ඔප්පුව ලියන ලද්දේ පුංචි බණ්ඩා රණරාජා නැමති ප්‍රසිද්ධ නොතාරිස් තැන වේ. රාජා හා කන්දා ලෙස හැඳින් වූ මෙම ඇත් පැටවුන් දෙදෙනාගෙන් රාජා නැමති හස්තියා පළමුව රැකබලා ගැනීමේ වගකීම පැවරුනේ අරඹෙගම කිරිහාමි නැමති ඇත්ගොව්වාටය. මෙලෙස වසර 12ක පමණ කාලයක් ගිරාගම වව්වේ හැදීවැඩුණු මෙම ඇත් පැටවුන් දෙදෙනා වසර 1937 ජූලි 13 වන දින මාම්පිටිය දිසාවේ විසින් ශ්‍රී දළදා මාලිගාවට නීත්‍යානුකූලව ඔප්පුවකින්, එවකට දියවඩන නිළමේ, ටී.බී.රත්වත්තේ මැතිතුමාට භාර දුන් අතර මෙම ඇත් පැටවුන් දෙදෙනා 1937 වසරේ පැවති දළදා පෙරහැරට සහභාගීවන්නට තරම් වාසනාවන්ත වූහ.

එම කාලය තුළ මහනුවර දළදා පෙරහැරේ කරඬුව වැඩම කරවීමේ භාරදූර කටයුත්තට හිමිකම් කී මහරාජා ඇතා හා ඉඩම්පිටියේ ඇතා යන ඇතුන්ගේ අභාවයත් සමඟ පෙරහැරේ දළදා කරඬුව

වැඩමවීමේ භාග්‍ය රාජා ඇතුට හිමිවිය. වර්ෂ 1959 දී පැවති දළදා පෙරහැර අවස්ථාවේ සිදු වූ අලි කුලප්පුවේ දී සියලුදෙනා කලබල වී දිවගියද රාජා ඇතා පිටමත බැඳි රන්සිවි ගෙය තුළ තැම්පත් කර තිබූ ශ්‍රී දළදා කරඬුව ආරක්ෂා කරන ලද්දේ කිසිදු කලබලවීමකින් තොරවය. ශ්‍රී දළදා කරඬුව වැඩම කරවීම සෑම ඇතෙකුටම හිමි නොවන කටයුත්තකි. සධාතුක කරඬුව වැඩම කරවීම පිණිස තෝරාගනු ලබන ඇතෙකු සතුව පිහිටිය යුතු මංගල කරුණු ගණනාවකි.
පෞරාණික හස්ති ශිල්පයට අනුව සධාතුක කරඬුව වැඩම කරවන මංගල හස්තියෙකු තුළින් විද්‍යමාන විය යුතු ලක්ෂණ අතර සතර පා, හොඬ, වල්ගය, ලිංගය යන ස්ථාන හත (07) භූමි ස්පර්ශ විය යුතුය. පිටෙහි කොඳුනාරටිය සමතලාවීම, මෙන්ම අභිමානවත් ලෙස හිස ඔසවා ගමන් කිරීම ද අවශ්‍ය වේ. මෙම සියලු ලක්ෂණ රාජා සතු වෙද්දී බොහෝ ඇතුන් අතර දක්නට නොලැබෙන ලක්ෂණයක් වන දකුණු දළයට වඩා වම් දළය මදක් උස්ව පිහිටීම රාජා ඇතු සතු සියලු අංග ලක්ෂණයන්ගෙන් පරිපූර්ණ වූ ඇතෙකු ලෙස රාජා ඇතා හඳුන්වා දිය හැකිය.

රාජා හස්තියා ස්වකීය බුද්ධි මහිමය ප්‍රකට කරමින් කටයුතු කළ අවස්ථා ගණනාවක්ද අපට ඉතිහාසය තුළ හමුවේ. එවැනි සදානුස්මරණ සිදුවීම් ගෙවා දමමින් ස්වකීය ජීවන මග පැමිණි රාජා ඇතා 1980 දශකයේ අගභාගයට පැමිණෙත්ම ක්‍රමයෙන් දුර්වල ලක්ෂණ පෙන්නුම් කරන්නට විය. 1986 වසරේදී දැඩි ලෙස රෝගාතුර වූ රාජා ඇතුට රාජ්‍ය අනුග්‍රහය ලබාදී ප්‍රතිකාර සිදුකිරීමට එවකට රාජ්‍ය නායකයන් පශුවෛද්‍ය අංශවලට සහ එවකට දියවඩන නිළමේ නෙරංජන් විජයරත්න මහතාට උපදෙස් ලබාදී තිබුණි. ඇසළ පෙරහැරේ අඩසියවසක කාලයක් සිදුකරන ලද උදාර මෙහෙය ඇගයීමට ලක් කිරීමක් වශයෙන් 1986 අගෝස්තු මස 20 වන දින මහනුවර ජනාධිපති මන්දිරයේදී එවකට රාජ්‍ය නායක ජේ.ආර්.ජයවර්ධන මහතා විසින් රාජා ඇතා ජාතික වස්තුවක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. මෙවැනි සම්මානයකින් සම්මානිත ලොකයේ දෙවැනි හා ආසියාවේ පළමු හස්තියා වන්නේද රාජා ඇතු වේ. වරින් වර අසනීප ගති ලක්ෂණ පෙන්නුම් කළ රාජා 1987 ජනවාරි මස 01 වන දින සිදු වූ රිය අනතුර හේතුවෙන් පාද අප්‍රාණික තත්ත්වයට පත්වන්නට වූ නිසා අසනීප තත්ත්වය එන්න එන්නම වර්ධන විය. දැව ආධාරකයක් මත රඳවා සිටි රාජා ඇතාගේ රෝගී තත්ත්වය 1988 ජූලි මස 16 දින දරුණු වූ අතර එදින පෙරවරු 10.16 ට ඇතු මෙලොව හැර ගියේය.

රාජා ඇතුගෙන් සිදු වූ ඒ අමිල මෙහෙවර උදෙසා උපහාර වශයෙන් ඇතුගේ ජීවමාන ස්වරූපය ප්‍රති නිර්මාණය කිරීමට එවකට සිටි ජනාධිපතිතුමන් සහ දියවඩන නිළමේතුමන් පියවර ගන්නා ලදී. ඒ අනුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව රාජා ඇතුගේ ප්‍රති නිර්මාණය කරන ලද රුව දළදා මාලිගා භූමියේම තැම්පත්කොට කෞතුකාගාරයක් ලෙස නිර්මාණය කොට 1989 දෙසැම්බර් 12 වන දින මහජනතාවට විවෘත්ත කරන ලදී. රාජා ඇතාගේ උදාරතර ආගමික මෙහෙවර අගයනුවස් ශ්‍රී ලංකා මුද්දර කාර්යංශය නිවේදන අංක 182 යටතේ ශත හැත්තෑපහක වටිනාකමින් යුත් ශ්‍රී දළදා මාලිගාවේ රාජා හස්තියා යන මැයින් සමරු මුද්දරයක් නිකුත් කිරීමට පියවර ගන්නා ලදී. එය මියගිය හස්තියෙකු වෙනුවෙන් මුද්දරයක් නිකුත් කළ ආසියාවේ ප්‍රථම අවස්ථාව වේ.

**හෙයියන්තුඩුවේ රාජා හස්තියා**

ශ්‍රී දළදා මාලිගාවේ රාජා ඇතුට පසු ශ්‍රී දළදා පෙරහැරේ කරඬුව වැඩම කරවීමේ අවස්ථාවට හිමිකම් කියූ හෙයියන්තුඩුවේ රාජා නැමති හස්තියා ඉතා දිගු දළ යුගලයකට උරුමකම් පෑ ඇතෙකි. මෙම ඇතා හම්බන්තොට දිස්ත්‍රික්කයේ කට්ටකඩුවන කැලයෙන් 1945 වර්ෂයේ මාර්තු 08 දින අල්ලා ගන්නා ලදී. මෙම ඇත් පැටවා පසුව ඉංග්‍රීසි ආණ්ඩුව මගින් හම්බන්තොට කච්චේරියේදී ප්‍රසිද්ධියේ වෙන්දේසි කරන ලදී. මෙම වෙන්දේසියේ දී රුපියල් 10500 ක මුදලකට බියගම හෙයියන්තුඩුව වලව්වේ විලියම් ගුණසේකර මහතා විසින් මිලදීගෙන ඇති අතර එතැන් පටන් ඇත් පැටවා හෙයියන්තුඩුව රාජා යන නමින් සුප්‍රසිද්ධ විය. ඉඩම් හිමි ධනවත් ප්‍රභුවරයෙකු වූ හෙයියන්තුඩුවේ විලියම් ගුණසේකර මහතා එකල අලි 14 දෙනෙකුගේ හිමිකරුවෙකු වූ අතර ඔහුගෙන් පසු ඇතාගේ හිමිකාරීත්වය ඔහුගේ පුත් හෙන්රි ගුණසේකර මහතාට හිමිවිය. දළදා මාලිගාවේ රාජා ඇතුගේ මියයාමෙන් පසු එනම් 1989 වර්ෂයේ සිට ඇසළ පෙරහැර මංගල්‍යයේ දළදා කරඬුව වැඩම කරවීම සිදුකරනු ලැබුවේ මෙම ඇතු විසිනි. මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ පවත්වනු ලබන වාර්ෂික පෙරහැරේ මෙන්ම ගංගාරාම නවම් පෙරහැර, කැළණිය දුරුතු පෙරහැර ආදී පෙරහැරවලටද සිය දායකත්වය ලබාදී ඇත. එම කාලයේ ශ්‍රී ලංකාවේ ජීවත් වූ දිගම දළ හිමි ඇතු ලෙස ගෞරවයට පාත්‍ර වුයේද මෙම හෙයියන්තුඩුවේ රාජා ඇතුය. එකල දළ යුවලේ දිග උඩි 07 යි අඟල් 06 ක් විය. මෙම හස්තියා ශ්‍රී ලාංකීය සිනමාවට මෙන්ම ලෝක සිනමාවට ද සිය දායකත්වය ලබාදී ඇත. ලොව සුප්‍රසිද්ධ ''ටෙම්පල් ඔෆ් ද ඩූම්'' චිත්‍රපටය ඇතුළු සිනමා නිර්මාණ රැසකට මෙම හෙයියන්තුඩුවේ රාජා ඇතා දායක කරගෙන ඇත. 2002 වසර වන විට හෙයියන්තුඩුවේ ඇතාා වයසත් සමඟ ක්‍රමයෙන් දුර්වල වන්නට විය. 2002 වසරේ නොවැම්බර් 06 වන දින මහනුවර දොඩම්වලදී දිවියෙන් සමුගත් සාඩම්බර හෙයියන්තුඩුවේ රාජා මිය යන විට ඇතුගේ වයස අවුරුදු 78කි. ඇතාගේ දේහයේ ශේෂ වූ අස්ථි සැකිල්ල වසර කිහිපයකට ගොඩගත් අතර එය ජපාන සමාගමක් විසින් එරට ප්‍රදර්ශනයට තැබීම සඳහා ඩොලර් 160000 ක මුදලකට ඉල්ලා සිටියද ඇතුගේ හිමිකරු වූ හෙන්රි ගුණසේකර මහතා විසින් එය ප්‍රතික්ෂේප කොට එය ජාතික වස්තුවක් ලෙස සලකා කිසිදු මුදලක් අය නොකර එම අස්ථි සැකිල්ල සහ දළ යුගලය ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාරය වෙත ප්‍රදානය කරන ලදී. ඒ අනුව එකලස් කරන ලද අස්ථි සැකිල්ල 2013 වසර ජනවාරි 29 වන දින කොළඹ ජාතික කෞතුකාගාරයේදී කෞතුක වස්තුවක් ලෙෂ ප්‍රදර්ශනයට විවෘත්ත විය.

**මිල්ලන්ගොඩ රාජා හස්තියා**

ශ්‍රී ලාංකීය පෙරහැර මංගල්‍යය සඳහා දායකත්වය ලබා දුන් දළ ඇතුන් අතර කෑගල්ල, මොලගොඩ ජීවත් වූ මිල්ලන්ගොඩ රාජා හස්තියා ලෝ ප්‍රකට වන්නේ ආසියාවේ දිගම දළ යුගලයට හිමිකම් කියූ හස්තියා ලෙස ය. එස්. ආර්. ඒ. මිල්ලන්ගොඩ මහතා මෙම මිල්ලන්ගොඩ රාජා ඇතුගේ හිමිකරුය. වයස අවුරුදු විසිදෙකක් පමණ වූ තරුණ වියේ දීම අලි ඇල්ලීමෙහි දක්ෂයෙකු වූ එතුමන් 1943 දී හම්බන්තොට ප්‍රදේශයෙන් අලි ඇතුන් දසදෙනෙකු පමණ අල්ලා ගත්තේය. ඒ

කාල වකවානුවේ මිල්ලන්ගොඩ මහතා අගුනකොළපැලැස්ස, හුන්ගම, බෝලාන, බූන්දල හා කොග්ගල යන ප්‍රදේශවලද බලපත්‍ර මත අලි ඇතුන් ඇල්ලීමේ කාර්යයේ නිරතවී ඇති අතර ඒ අවස්ථාවලදී අල්ලා ගන්නා ලද අලියෙකු සඳහා රුපියල් 2000 ක් 2500ක් අතර මිලක්ද දළ ඇතෙකු සඳහා රුපියල් 3000ක් පමණ වූ මිලක් ද නියම වී ඇත. 1945 වසරේදී එවකට ආණ්ඩුව විසින් නිකුත් කරන ලද පුත්තලම් දිස්ත්‍රික්කයේ අලි ඇල්ලීමේ බලපත්‍ර මත ආණමඩුව ප්‍රදේශයේ නවගත්තේගම වනයෙන් අල්ලා ගන්නා ලද ඇත් පැටවාගේ වයස අවුරුදු 08ක් පමණ වූ අතර උස අඩි 4ත් 5ත් අතර වී ඇත. මිල්ලන්ගොඩ රාජා ලෙස හැඳින් වූ මෙම හස්තියා කෑගල්ල මොලගොඩ පිහිටි මිල්ලන්ගොඩ වලව්වේ ඇතිදැඩි විය. මේ කාල වකවානුව වන විට මිල්ලන්ගොඩ ඇත්ගාලේ අලි ඇතුන් විශාල සංඛ්‍යාවක් සිටි අතර ඒ අතරින් මෙම දළ ඇතුට විශේෂ ස්ථනයක් හිමිව ඇත. මහනුවර පෙරහැර මංගල්‍යයේ විෂ්ණු දේවාල පෙරහැරේ දේවාභරණ වැඩමවමින් පෙරහැර සඳහා මනා පුහුණුවක් ලබාගත් මෙම හස්තියා වසර 40ක් පුරාවට වරින් වර ශ්‍රී දළදා පෙරහැරේ කරඬුව වැඩමකරවීමේ භාරදූර කර්තව්‍ය ඉටුකරන ලදී. ඇත්ගොව්වන් කිහිපදෙනෙකු විසින්ම රැකබලා ගන්නා ලද මෙම හස්තියා වැඩිම කාලයක් රැකබලා ගන්නා ලද්දේ අප්පු නැමති පළපුරුදු ඇත්ගොව්වා විසිනි. මෙම ඇත්ගොව්වා සහ මිල්ලන්ගොඩ රාජා අතර දැඩි බැඳීමක් තිබී ඇත. දක්ෂ බටනලා වාදන ශිල්පියෙකු වූ අප්පු මිල්ලන්ගොඩ රාජා ද බටනලා සංගීත ශ්‍රාවකයෙකු බවට පත්කර තිබුණි. දේහ ලක්ෂණ අනුව මිල්ලන්ගොඩ රාජා උසස් කුලයකට අයත් බව අතුගේ හිමිකරු වූ මිල්ලන්ගොඩ මහතා පවසා සිටියි. පෙරහැර ආදී සංස්කෘතික කටයුතුවලට පමණක්ම යොදාගත් මෙම හස්තියාගෙන් කිසිදු දිනයක මුදල් ඉපයීම සිදුනොකළ බවද ඔහු වැඩිදුරටත් පවසයි. රාජා අවසන් වරට 2008 වසරේදී දළදා කරඬුව වැඩම කරවූ පසුව හස්තියාගේ වයෝවෘද්ධ භාවය නිසාම ඇති වූ රෝගී තත්ත්වය හේතුවෙන් පෙරහැරට සහභාගී නොවීය. 2011 වසරේ අගෝස්තු මස 03 වන දින, වසර 73ක් ආයු විඳි ආසියාවේ දිගම දළ හිමි ඇතු වූ මිල්ලන්ගොඩ රාජා හස්තියා තම දිවිගමන නිමා කළේය. මිල්ලන්ගොඩ මහතා ඇතුළු පවුලේ අයගේ අදහස් පරිදි ආසියාවේ සාඩම්බරය වූ මෙම මිල්ලන්ගොඩ හස්තියා ඉදිරි පරපුරටද දැකගත හැකි පරිදි සංරක්ෂණය කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව මිල්ලන්ගොඩ මහතාගේ පෞද්ගලික මුදල් යොදවා හස්තියාගේ සිරුර සංරක්ෂණය කොට තැම්පත් කරන ලද කෞතුකාගාරය 2012 සැප්තැම්බර් මස 02 දින ජනතා අයිතියට පවරන ලදී.

**නැඳුන්ගමුව රාජා**

ශ්‍රී ලංකාවේ හීලෑ අලි ඇතුන් පිළිබඳව කතා කිරීමේ දී නැඳුන්ගමුවේ රාජා හස්තියාට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. නැඳුන්ගමුවේ රාජා ලෙස හඳුන්වනු ලබන මෙම හස්තියා ඉන්දියාවේ සිට මෙරටට ගෙනෙන ලද්දේ 1954 වසරේදීය. ඒ ඉන්දියාවේ මයිසූර් ප්‍රාන්තයේ මහරාජාවරයෙකුට වැළඳුණු රෝගයක් සුවකර ගැනීමට ශ්‍රී ලංකාවේ නීලම්මහර වෙද හාමුදුරුවන් විසින් සිදුකරන ලද සේවයට තුටු පඬුරක් ලෙසිනි. එලෙස නීලම්මහර වෙද හාමුදුරුවන්ට පූජා කිරීම සඳහා ඉන්දියාවේ මයිසූර් ප්‍රාන්තයේ සිට ඇත් පැටවුන් දෙදෙනෙකු ගෙනඑන ලද අතර මීට වසර කිහිපයකට පෙර කොළඹ ගංගාරාම විහාරස්ථානයේ සිටි නවම් රාජා ඉන් එක් ඇතෙකු වේ. නීලම්මහර වෙද හාමුදුරුවන් විසින් පසුකාලීනව මෙම ඇත් පැටවුන් දෙදෙනා වෙනත් පාර්ශවයකට පවරා ඇති

අතර එහිදී වර්තමානයේ නැඳුන්ගමුවේ රාජා ලෙස සැලකෙන ඇත් පැටවා හොරණ උඩුව ප්‍රදේශයේ ප්‍රභූ පවුලකට හිමිව තිබුණි. අනික් ඇත් පැටවා ඇඹිලිපිටිය ප්‍රදේශයේ අලි හිමිකරුවෙකුට හිමිවිය. පසුව ගම්පහ නැඳුන්ගමුව ප්‍රදේශයේ ජීවත් වූ පඬුවාවල වෙද පරපුරේ, වෛද්‍ය ශිරෝමනී පණ්ඩිත පී.ඩී.පී.ධර්මවිජය වෙදරාළහාමි හොරණ උඩුව ප්‍රදේශයේ සිටි ඇත් පැටවා මිලදී ගෙන නැඳුන්ගමුව වලව්වේ තම ඇත් පන්තියට එක්කරගෙන ඇත. එතැන් පටන් මෙම ඇත් පැටවා නැඳුන්ගමුව රාජා ලෙස හඳුන්වා ඇත. නැඳුන්ගමුව ඇත් පන්තිය තුළ හැදීවැඩුණු මෙම හස්තියාගේ පසුකාලීන උරුමකරු වූයේ දේශීය වෛද්‍ය හර්ෂ ධර්මවිජය මහතාය. මහනුවර දළදා පෙරහැරෙහි දළදා කරඬුව වැඩම කරවීමට තරම් භාග්‍යවත් වූ මෙම ඇතුට ඒ සඳහා අවශ්‍ය ශරීර අංග ලක්ෂණවල පරිපූර්ණත්වය ද හිමි විය. වසර 2005 දී ප්‍රථමවරට රාජා ඇතු දළදා පෙරහැරට සහභාගී විය. 2006 වසරේ සිට දළදා පෙරහැරේ කරඬුව වැඩම කරවීම සිදු කරන ලදී. නැඳුන්ගමුවේ රාජාගේ පවතින සුවිශේෂිතාවයවනුයේ ගම්පහ නැඳුන්ගමුවේ සිට දින 05ක් පුරාවටම පා ගමනින් පැමිණ මහනුවර පෙරහැරට සහභාගීවීමය. මෙම හස්තියාගේ හිමිකරු වන හර්ෂ ධර්මවිජය මහතා පවසනුයේ ඇතුගේ සෞඛ්‍ය තත්ත්වය මෙන්ම ආරක්ෂාව ගැනද සලකා කිසිඳු දිනක ලොරි රථවලින් ප්‍රවාහනය නොකරන බවත් සහභාගී වන සෑම පෙරහැරකටම පා ගමනින් ගොස් සහභාගී වන බවත්ය. වර්තමානයේ ආසියාවේ සිටින උසම සහ ලොකුම දළ ඇතාද වන්නේ නැඳුන්ගමුවේ හස්තියාය.